නිපුණතාව 16 - ව්‍යාපාර සාර්ථකත්වය සඳහා මානව සම්පත සඵලදායකව සහ කාර්යක්ෂමව යොදා ගන්නා අයුරු විමසයි.

නිපුණතා මට්ටම 16.6 - බඳවා ගැනීමේ හා අනුස්ථාපන ක්‍රියාපටිපාටිය අධ්‍යයනය කරයි.

<u>බඳවා ගැනීම</u>

තෝරා ගැනීමෙන් පසු යෝග්‍යතම පුද්ගලයන් රැකියා තනතුරුවලට පත් කිරීමේ නීත්‍යානුකූල ක්‍රියාවලිය

<u>සේවකයන් බඳවා ගැනීමේ පදනම්</u>

- ස්ථිර පදනම
- තාවකාලික පදනම

➢ ආයතනයක රැකියාවක් සඳහා ස්ථිර වශයෙන්ම සේවකයන් බඳවා ගැනීම ස්ථිර පදනම මත සේවකයන් බඳවා ගැනීමයි.මෙසේ බඳවා ගන්නා සේවකයා ආයතනයේ ප්‍රධාන කාර්යන්ට සම්බන්ධ වන ස්ථිර කාර්ය මණ්ඩලයේ සේවකයෙකු ලෙස සැලකෙන අතර,ස්ථිර කාර්ය මණ්ඩලයේ සේවකයෙකු සතු සියලු වරප්‍රසාද සේවකයාට හිමි වේ.පත්වීම් ලිපියක පරිවාස කාලය ද සඳහන් වේ.

➢ ආයතනයක ස්ථිර පදනමෙන් තොරව සේවකයන් බඳවා ගැනීම තාවකාලික පදනම මත සේවකයන් බඳවා ගැනීමයි.මෙම සේවකයන්ට ලබා දෙන පත්වීම් ලිපියේ තාවකාලික පදනම යන්න සඳහන් වේ.

➢ සේවකයෙකු සේවයට පත් කිරීමෙන් පසු ඔහුට හෝ ඇයට හෝ රැකියාව පිළිබඳ කටයුතු,රාජකාරි,වගකීම් හා කොන්දේසි ආදිය විස්තරාත්මකව දක්වමින් සේවා යෝජකයා විසින් දෙනු ලබන නීත්‍යානුකූල ලියවිල්ල පත්වීම් ලිපියයි.

➢ පත්වීම් ලිපිය රැකියා ගිවිසුමක් ඇති වූ බවට ලැබෙන ලිඛිත සාක්ෂ්‍යයක් සේ සැලකේ.

➢ පත්වීම් ලිපිය නීත්‍යානුකූල ලියවිල්ලක් බැවින් එය සේවායෝජකයාට හා සේවාදායකයාට එක සේ වැදගත් වේ.

1. පත්වීම් ලිපියක වැදගත්කම දක්වන්න.